**ගම්පහ මහා නගර සභාව - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගම්පහ මහා නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහ නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ගම්පහ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 **විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතා අනුව ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබූ පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

1.1 (ආ), (ඇ), (ඉ), (උ), (ඌ), (ඔ), (ඕ), (ක), (ග), (ට), (ඩ), (න), (ත), (ද), (ප), (බ)

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

1.6.1 **පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම**

| **අදාළ ප්‍රමිතියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| 6.3 | ඉඩම් හා ගොඩනැගිලි වෙන් වෙන්ව හඳුනාගෙන ගිණුම්ගත කළයුතු වුවද එසේ කර නොතිබුණි. | ඉඩම් / ගොඩනැගිලි වෙන් වෙන්ව හඳුනාගෙන ගිණුම් තැබීමට කටයුතු කරන බව දන්වමි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

1. 6.2 **ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන කොමසාරිස්ගේ (බ.ප.) 2020 අගෝස්තු 27 දිනැති චක්‍රලේඛ අංක LGD/09/2019(1) අනුව ජංගම නොවන වත්කම් කේත අංක 2100 යටතේ වත්කම් වර්ග 14 ක් ලෙස වර්ගකර තිබුණද සභාව දේපල, පිරියත හා උපකරණ වර්ගකර තිබුණේ අයිතම 09 ක් යටතේ පමණි. | අයිතම 14ක්, 9ක් ලෙස පමණක් වර්ග කර තිබීම පිළිගනිමි. 2021 වර්ෂයේදී ගිනි ආරක්ෂක ඇඳුම් කට්ටල, සවිකිරීම්, පරිඝණක මෘදුකාංග හා යන්ත්‍ර පිරියත වර්ග කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් වන දායකය රු.66,965,713 ක් ප්‍රාග්ධන ප්‍රධාන ගිණුමට බැර කළ යුතු වුවද ආදායමට බැර කිරීම හේතුවෙන් එම වටිනාකමින් ආදායම වැඩියෙන් දක්වා තිබුණි. | වියදම් සඳහා රජයෙන් වන දායකය සඳහා ක්ෂය ප්‍රතිපාදන 2020 වර්ෂයේ වෙන්කර නැති බව පිළිගනිමි. අලුත් ගිණුම් ක්‍රමය අනුව ක්ෂය ගැලපීම් නොකිරීමට සහනය 2020 වර්ෂයට ලබා දී ඇති නිසා එසේ නොකල බව දන්වමි. | ක්ෂය වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | ජර්නල් සටහන් අංක 46,49,57,64 හා 67 අනුව සමුච්චිත අරමුදල් ගිණුමට රු.73,664,850 ක් බැර විය යුතු ව තිබුණද ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයෙහි සමුච්චිත අරමුදල් ගිණුමට එම වටිනාකම ගලපා නොතිබීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට රු.33,425,546 ක් විය යුතු වූ අතිරික්තය 40,239,304 ක ඌනතාවයක් ලෙස දක්වා තිබුණි. | මේ පිළිබඳව තවදුරටත් සොයා බලා පිළිතුරු දෙමි. | ජර්නල් සටහන් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඈ) | ලෙජරයේ අගය ලියාහැරි අත්තිකාරම් ගිණුමක් විවෘතකර නොතිබූ අතර විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව අගය ලියාහැරීම් වෙනත් වියදම් ගිණුමට මාරුකර තිබුණි. අගය ලියාහැරි වටිනාකම රු.23,710,952 ක් වෙනත් වියදම් ගිණුමට මුදලින් කළ වියදමක් ලෙස ගිණුම්ගතකර තිබුණි. | පිළිගනිමි. ඉදිරියේදී අගය ලියා හැරීමේ අත්තිකාරම් ගිණුමක් විවෘත කර පවත්වා ගෙන යමි. | අගය ලියාහැරීමේ ගිණුමක් පවත්වා ගත යුතු වේ. |
| (ඉ) | 2019 දෙසැම්බර් 31 දිනට පිරියත හා යන්ත්‍ර ගිණුමේ ශේෂය රු.29,645,329 ක් වුවද, එදිනට කාර්යාල උපකරණ ගිණුමේ ශේෂය වූ රු.4,680,665 ක් පිරියත හා යන්ත්‍ර ගිණුමේ ආරම්භක ශේෂය ලෙස දක්වා තිබුණි. | පිළිගනිමි. මෙය පරිගණක ගත කිරීමේදී ඇති වූ දෝෂයකි. | ගිණුම් ශේෂයන් නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ බඳුන් හා උපකරණ ගිණුමේ ආරම්භක ශේෂයක් නොතිබුණද පිරියත හා යන්ත්‍ර ගිණුමේ ආරම්භක ශේෂය වූ රු.29,645,329 ක් බඳුන් හා උපකරණ ගිණුමේ ආරම්භක ශේෂය ලෙස දක්වා තිබුණි. | පිළිගනිමි. මෙය පරිගණක ගත කිරීමේදී ඇති වූ දෝෂයකි. | ගිණුම් ශේෂයන් නිවැරදිව ගිණුම්වලට ගත යුතු වේ. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ ලැබියයුතු වරිපනම් ගිණුමේ අවසන් දිනට ශේෂය වූ රු.59,310,442 ක් අවසන් ගිණුමේ රු.60,019,840 ක් ලෙස දක්වා තිබීමෙන් අවසන් ගිණුම රු.709,398 ක් වැඩියෙන් දක්වා තිබුණි. | යක්කල උපකාර්යාලයේ 2020/12/31 වැනි දිනට ලැබිය යුතු වරිපනම් ශේෂය ජර්නල් සටහනට පිටපත් කිරීමේදී රු.709,398ක් වැඩිපුර සටහන් වී ඇත.<br>උක්ත දෝෂය 2021 ආරම්භක | ලෙජර් ගිණුමේ ශේෂය නිවැරදිව අවසන් ගිණුමට ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| | ශේෂ නිවැරදි කිරීම යටතේ නිවැරදි කරමි. | |
| (ඌ) හුවමාරු නොවන ගණුදෙනු වලින් ලැබිය යුතු දෑ සටහනේ එකතුව රු.117,383,709 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ රු.117,317,361 ක් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් ජංගම වත්කම් රු.66,348 කින් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | පිළිගනිමි. අවසන් මූල්‍ය ප්‍රකාශනයේ හුවමාරු ගණුදෙනු වලින් ලැබිය යුතු දෑ වලට අදාල 16 වන සටහනෙහි ලැබිය යුතු කුලී නිවාස වටිනාකම වන රු.66,348.75 ක මුදල පරිගණක දෝෂයක් මත එකතුවට ඇතුළත් නොවීම මත මෙම ගැටළුව පැන නැගී ඇත. | අඩුවෙන් ගිණුම් ගත වීම නිවැරදි කළ යුතු වේ. |

2. **මූල්‍ය සමාලෝචනය**

-----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අතිරික්තය රු.132,650,873 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.216,488,567 ක් විය.

2.2 **මූල්‍ය පාලනය**

---------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 24 දිනැති අංක - 2155/6 ගැසට් පත්‍රයේ 1 වන පරිච්ඡේදයේ 25 වන වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ නගරාධිපතිවරයාට උප නගරාධිපතිවරයාට හෝ වෙනත් කවර හෝ සභිකයෙකුට, නාගරික කොමසාරිස් හෝ වෙනත් කවර හෝ නිලධාරියෙකු වෙත පළාත් පාලන ආයතනයේ නියෝජිතයෙකු, නිලධාරියෙකු වශයෙන් සලකා පිරිනමන කවර හෝ ත්‍යාගයක්, පරිත්‍යාගයක් එය මහා නගර සභාවට සිදුකරන ලද ප්‍රදානයක් වශයෙන් සලකා කටයුතු කළයුතු අතර එවැනි පරිත්‍යාග මහා නගර සභා ආඥා පනතේ 185 වගන්තිය ප්‍රකාර මහා නගර සභා අරමුදලට බැර කළයුතුය. එහෙත් රාජ්‍ය බැංකුවක නගරාධිපති අරමුදල නමින් බැංකු ගිණුමක්, නගරාධිපතිවරයාට ලැබෙන පරිත්‍යාග වලින් පවත්වාගෙන ගොස් තිබූ අතර 2020 වර්ෂයේ ජූලි මස සිට දෙසැම්බර් දක්වා වූ මාස 06 තුල අවස්ථා 09 කදී එකතු වටිනාකම රු.1,028,743 ක් ගිණුමට බැරවී තිබුණ අතර අවස්ථා 29 කදී එකතු | නගරාධිපතිතුමන්ගේ සමාජ කාර්යයන් කෙරේ ඇති ප්‍රසාදය හා විශ්වාසය මත සභා අරමුදලට ලබා නොදෙන මුදල් ලබා ගන්නා ක්‍රමයක් ලෙස නගරාධිපති අරමුදල හැඳින්විය හැකිය. නගරාධිපති අරමුදලේ සියළුම වියදම් චෙක්පත් මඟින් පමණක් කර ඇති බව පෙන්වා දෙමි. මහා නගර සභා අඥා පනතේ අංක 185 යටතේ ලැබෙන සියළු ආදායම් ද, අංක 188 යටතේ කරන සියළු වියදම් ද, සභා අරමුදල යටතේම සිදු කර ඇත මෙයට අදාල ලදුපත්, බිල්පත් ගෙවීම් වවුචර් යන ආදි ලියවිලි ලබා ගැනීමට නගරාධිපති කාර්යාලය කොවිඩ් වසංගත තත්ත්වය මත වසා ඇති නිසා නොහැකි විය | මහා නගර සභා ආඥා පනතේ 185 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

වටිනාකම රු.1,016,425 ක ගෙවීම් පැවතුණි. මෙම ගණුදෙනුවලට අදාලව ලදුපත්, බිල්පත්, ගෙවීම් වවුචර් හෝ පිළිගතහැකි කිසිදු ලියවිල්ලක් ඉදිරිපත් නොකෙරුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 වරිපනම් හා බදු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණ වාර්තාව අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.62,346,436 ක වරිපනම් හා බදු වටිනාකමක් අයකර ගැනීමට තිබූ අතර, එයින් හිඟ හිටි ශේෂය වසරක කාලයක සිට රු.7,701,937 ක්ද, වසර 01 ත් 03 ත් අතර රු.7,771,270 ක්ද, වසර 3 ත් 5 ත් අතර රු.20,206,589 ක්ද, වසර 5 ත් 10 ත් අතර රු.26,666,641 ක් ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයේදී කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ක්ෂේත්‍ර ආදායම් රැස් කිරීම් අකර්මන්‍යව පැවතිනි.එසේම බදු පැහැර හරින්නන්ට ක්‍රියාමාර්ග ගැනීම වෙනුවට බදු සහන ලබා දීමට සිදු විය. මෙම හිඟ කාල විශ්ලේෂණ පෙන්වාදීම් අනුව හිඟ ඉහල කාලයක් ඇති හිඟ වරිපනම් අයකිරීම සඳහා ප්‍රමුඛතාව ලබාදීමටද කටයුතු කරමි. තවද අයකර ගැනීමට නොහැකි හිඟ ආදායම් පිළිබඳව හේතු අනාවරණය කර ගනිමින් එම ආදායම් කපා හැරීමටද කටයුතු කරමි. | හිඟ වරිපනම් හා බදු රැස්කරගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ලැබිය යුතු වරිපනම් ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු.60,019,840 ක් වුවද, උපලේඛන අනුව රු.59,310,442 ක් වීමෙන් රු.709,398 ක වෙනසක් නිරීක්ෂණය විය. | රු.709,398 ක වෙනසක් නිරූපණය වනුයේ 2020/12/31 වැනි දිනට ලැබිය යුතු වරිපනම් ශේෂය ජර්නල් සටහනට පිටපත් කිරීමේදී ඇති වූ දෝෂයක් වන බැවින් උක්ත දෝෂය 2021 ආරම්භක ශේෂ නිවැරදි කිරීම් යටතේ නිවැරදි කිරීමට වගබලා ගනිමි.ඒ අනුව 2021/12/31 ලැබිය යුතු වරිපනම් ගිණුමෙහි නිවැරදි ශේෂ වටිනාකම රු.59,310,442 වන බව මෙමගින් පෙන්වා දෙමි. | උපලේඛන ශේෂය හා මූල්‍ය ප්‍රකාශන ශේෂය සැසඳිය යුතු වේ. |

2.3.2 විනෝද බදු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සිනමා ශාලා 5 කින් රු.5,067,942 ක් වටිනා හිඟ විනෝද බදු ආදායමක් අයකරගැනීමට පැවති අතර එයින් රු.4,793,162 ක් වූ හිඟ වටිනාකමක් පබ්ලික් සිනමා ශාලාවෙන් අයකරගැනීමට පැවතුණි. | සිනමා ශාලා විවෘත වූ සැනින් හිඟ අයකර ගැනීමට කටයුතු කරමි. පබ්ලික් සිනමා ශාලාවේ නඩු තීන්දුව ප්‍රකාරව ආයතනය කටයුතු නොකිරීම නිසා නඩු කටයුත්ත යාවත්කාලීන කිරීම සඳහා නාගරික නීති නිලධාරි වෙත ගොනුව යොමු කර ඇත. | හිඟ බදු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

2.3.3 කඩ කුලී

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ කඩ කුලී වටිනාකම රු.36,218,243 ක් වූ අතර වසර 1 ට අඩු , වසර 1 ත් 3 ත් අතර, වසර 3ත් 5ත් හා වසර 5 ත් 10 ත් අතර පිළිවෙලින් රු.13,352,139 ක්, රු.7,323,722 ක්, රු.3,686,205 ක්, රු.11,856,177 ක් ලෙස අයකර ගැනීමට තිබූ බව නිරීක්ෂණය විය. | 2020 වර්ෂයේදි කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ක්ෂේත්‍ර ආදායම් රැස් කිරීම් අකර්මනාව පැවතිනි. එසේම කුලී පැහැර හරින්නන්ට ක්‍රියාමාර්ග ගැනීම වෙනුවට බදු සහන ලබා දීමට සිදු විය.<br>එනමුත් මෙම තත්ත්වය යටතේ වුවද විවිධ හේතු මත විශාල කාලයක් නොගෙවා සිටි කුලිය අයකරගැනීම සඳහා 2021 වර්ෂයේදී කටයුතු කරනු ලැබූ අතර ඒමඟින් මෙම විෂය මඟින් මිලියන 11ට වැඩි ආදායමක් එකවර සභාවට අයකර ගැනීමට හැකිවිය. | හිඟ කඩ කුලී වටිනාකම අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

2.3.4 වෙනත් ආදායම්

වාහන නැවතුම් ගාස්තු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වාහන නැවතුම් ස්ථාන 5 කින් අයවිය යුතු රු.1,641,456 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ටෙන්ඩර් ගාස්තු ගෙවීම් පැහැර හැරීම මත මෙම ශේෂය පැන නැගී ඇත. ටෙන්ඩර්කරුවන්ගෙන් අදාල වසරේදීම එම පරිශ්‍රයන් අත්පත් කරගෙන සභා සේවකයින් යොදා ගාස්තු අයකිරීමට කටයුතු කරන ලදී. නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා දැනට මෙම හිඟ ගොනු නාගරික නීති අංශය වෙත යොමු කර ඇත. | හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

මහා නගරසභා ආඥාපනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය සහ සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ පෞද්ගලික ඉඩමකට කසළ බැහැර කිරීම වෙනුවෙන් ඉඩම් හිමිකරුවෙකුට රු.29,127,000 ක් ගෙවා තිබුණු අතර, 2020 සැප්තැම්බර් 07 දින කසළ බැහැරකරන ස්ථානය පිළිබඳව සිදුකළ භෞතික පරීක්ෂාවට අනුව, පරිසරයට නිරාවරණය වීම හා සෞඛ්‍යයට හානිවන අයුරින් කසළ කඳු ගොඩගසා තිබූ බව නිරීක්ෂණය වූ අතර, කසළ බැහැර කරන ස්ථානයට පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණ බවද, කසළ දමන ස්ථානයේ සෞඛ්‍යාරක්ෂිත බව පිළිබඳව සුපරීක්ෂාකාරී වන ලෙසත් හා ඒ පිළිබඳව වාර්තා කරන ලෙසත් ගම්පහ මහාධිකරණය විසින් සභාවේ සෞඛ්‍ය පරීක්ෂක වරයාට ලබාදී තිබුන නියෝගය අනුව සභාව කටයුතු කර නොතිබුණු බවද නිරීක්ෂණය විය. | 2019 වර්ෂයේ ගම්පහ මහා නගර සභාවේ කසළ කෙරවලපිටිය කසළ අංගනයට බැහැර කිරීම සිදුකළ අතර ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි පළාත් පාලන කොමසාරිස්ගේ අංක LGD/03/02/4/27 හා 2019/08/02 දිනැති ලිපියේ උපදෙස් වලට අනුව සභා තීරණයක් ගෙන පෞද්ගලික ඉඩමකට කසළ බැහැර කිරීම සිදු කරන ලදී. මෙම ස්ථානයේ කොම්පෝස්ට් නිෂ්පාදිත යන්ත්‍රයක් සවිකර ඇත.එය ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබාදුනි.අදාල බලපත්‍ර ලබා නොතිබූ බැවින් ඒ සඳහා මාස 03 ක් ඇතුළත බලපත්‍රය ලබාගන්නා ලෙසත් එහි පිටපතක් අප වෙත ඉදිරිපත් කරන ලෙසත් දන්වන ලදී. | කසළ බැහැර කිරීමේ කාර්යය සඳහා විධිමත්ව ටෙන්ඩර් පටිපාටි අනුගමනය කර කසළ බැහැරකරුවන් තෝරා ගතයුතු අතර විධිමත්ව ගෙවීම් හා කසළ බැහැර කිරීම් කටයුතු කළයුතු වේ. තවද කසළ බැහැර කරන ස්ථානයට බලපත්‍රයක් ලබාගැනීමද, අධිකරණය ලබාදුන් නියෝග ක්‍රියාවට නැංවීමද, කළ යුතු වේ. |

### 3.2 බඳවාගැනීම් පරීක්ෂාව

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය පරිපාලන 29/2019 හා 2019 සැප්තැම්බර් 18 දිනැති චක්‍රලේඛය පදනම්ව වැඩ/ක්ෂේත්‍ර කම්කරුවන් 37 දෙනෙකු හා සෞඛ්‍ය කම්කරුවන් 22 දෙනෙකු බඳවාගෙන තිබුණි. අදාල පත්වීම් ලබා දීමෙන් පසුව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කර කාර්ය මණ්ඩලය යාවත්කාලීන කරවා ගතයුතු බව රාජ්‍ය පරිපාලන 25/2014 හා 2014 නොවැම්බර් 12 දිනැති චක්‍රලේඛයේ | 2020 දෙසැම්බර් 31 දින වන විට වැඩ ක්ෂේත්‍ර කම්කරු හා සෞඛ්‍ය කම්කරු පුරප්පාඩු ප්‍රමාණය 38 කි .<br>කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ දෛනික කොරෝනා සහ නිරෝධායන මධ්‍යස්ථාන වල කසළ ඉවත් කිරීම , වල දැමීම, නගර සභා සීමාව තුළ දෛනිකව කොරෝනා තත්වයට ගොදුරු වන ප්‍රමාණය ඉහළ යාම සමඟ විෂබීජහරණ කටයුතු සිදුකිරීම,දෛනිකව PCR පරීක්ෂණ, Antigen පරීක්ෂණ සිදු කිරීම, | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ |

| | |
|---|---|
| දක්වා ඇතත් කාර්ය මණ්ඩලය යාවත්කාලීන කර නොතිබීම හේතුවෙන් එදිනට පැවති පුරප්පාඩු ප්‍රමාණය ඉක්මවා බඳවාගත් 28 දෙනා වෙනුවෙන් 2020 වර්ෂය සඳහා වැටුප් ලෙස සහා අරමුදලින් රු.11,608,800 ක් ගෙවා තිබුණි. | එන්නත්කරණය සිදු කිරීම, කොවිඩ් දැනුවත් කිරීමේ කොවිඩ් බලකාය ක්‍රියාත්මක කිරීම යන අත්‍යවශ්‍ය රාජකාරි ප්‍රමාණයක් වෙනුවෙන් විශාල වශයෙන් කාර්ය මණ්ඩලය අවශ්‍යව ඇත. |

3.3 **අවිධිමත් ගණුදෙනු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇඳිරි නීතිය කාලය තුල මහජනතාවට බෙදාදීම සඳහා, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාදී තිබූ ලේඛනයේ ඇතුලත් අඩු ආදායම් ලාභීන්ගේ මුළු සංඛ්‍යාව වෙනුවෙන් අවශ්‍ය තේ කොළ පැකට් ප්‍රමාණය පෞද්ගලික ආයතනයකින් ලබාදී තිබියදී, මහා නගර සභාව තේ කොළ පැකට් 6000 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.540,000 ක් ද, බෙදාහරින ලද වියළි ආහාර මල්ලෙහි අඩංගු නොවුන දෙවැනි බැත පැකට් 1000 ක් සහ බිස්කට් පැකට් 1000 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.215,000 ක් ද, ගෙවීම් කර තිබුණු අතර, සභාව විසින් අඩු ආදායම්ලාභීන් සඳහා බෙදා දීමට එළවළු කිලෝ ග්‍රෑම් 5,774 ක් මිලදී ගෙන තිබුණද මන්ත්‍රීවරුන් වෙත නිකුත් කර තිබුණේ කිලෝ ග්‍රෑම් 4,014 ක් පමණක් බවද නිරීක්ෂණය විය. | ඉදිරියේදී පිළිතුරු ලබාදීමට කටයුතු කරමි. | සභාවට සිදුකර තිබූ පාඩුව වගකිවයුතු තැනැත්තන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |